# චීනයේ ශාන් රාජවංශයේ සොහොන්වලින් හෙළිවන බිලිපූජා

ආචාර්ය ගාමිණී රණසිංහ
කථිකාචාර්ය ඉනෝජ් කෞශල්‍ය අබේනායක

"සොහොන්" (Tombs) යන්න ග්‍රීක භාෂාවේ Tymbos යන්නෙන් බිඳී ආවකි. ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට වර්තමානය දක්වා ම මානවයා පිළිබඳ සත්‍යය රැසක් අනාවරණය වන මූලාශ්‍රයක් ලෙසට සොහොන් හැඳින්විය හැකිය. ඉතාම සරල ආකාරයට ආරම්භ වූ සොහොන් තැනීම මානවයාගේ භෞතික දියුණුවත් සමග වඩාත් සංකීර්ණ වාස්තු විද්‍යාත්මක අංගයක් බවට පත්විය. ප්‍රාථමික සමාජ විශ්වාසය වූයේ මරණින් මතු තවත් ආත්මයක් තිබෙන බවත් ඇතැම් විට මෙලොව පැවති ශරීරයෙන් ම එම දෙවන උපත ලබාගත හැකි බවයි. වෙනත් ශිෂ්ටාචාර මෙන් ම චීනයේ ද අවම වශයෙන් මීට වසර 18000 කට පෙර සොහොන් තැනීම ආරම්භ වී ඇත. චෞකෝඩියන් (Zhoukoudian) ගුහාවෙන් අනාවරණය වී ඇති සොහොන් නිර්මාණ සාධක සමකාලීන මානවයා පිළිබඳව අධ්‍යයනය කිරීමට ඇති ඉතා වැදගත් සාධකයකි. සෑම පැරණි ශිෂ්ටාචාරයකම බිලිදීම් පිළිබඳ වාර්තා වී ඇත (liu, 2004). එහෙත් සෑම ශිෂ්ටාචාරයකට ම වඩා චීනයේ ශාන් රාජවංශයට (Shang Dynasty-1600-1046 BC), බිලිදීම සම්බන්ධයෙන් ප්‍රමුඛතාවක් ලැබේ. ක්‍රි.පූ. 1800 දී පමණ කහගඟ (Yellow River) මුල්කර ගනිමින් ශාන් රාජවංශයේ ප්‍රාථමික අවධිය නිර්මාණය වී තිබේ



(Wyse 1988). අනතුරුව හේනාන් (Henan), හුබෙයි (Hubei) ශන්දොන් (Shandong) යන පළාත් අයත්වන විශාල භූමියක් පුරා විසිරී ගිය කලාපයකට ශාන් රාජවංශය බලය පතුරා තිබිණි. ධීවර හා කෘෂිකර්මාන්තය මුල්කොට ගනිමින් ආරම්භ වන මෙම කාල වකවානුවට තඹ හා ලෝකඩ, කර්මාන්තයෙන් මහත් ආලෝකයක් ලැබිණි. ශක්තිමත් ලෝහයෙන් තනාගන්නා ලද උපකරණ කෘෂිකර්මාන්තයේ පමණක් නොව යුද්ධ හා ආක්‍රමණ සඳහා ද එකසේ උපකාර විය. රජවරු විසිනව දෙනෙකු යටතේ පාලනය වූ මෙම රාජවංශයේ අගනුවර අවස්ථා ගණනාවකදී ම වෙනස් වූ අතර අවසන්වරට කහ ගඟේ අතුගංගාවක් වූ හු-ආන් හෝ (Huan Ho) නිම්නය තෝරාගන්නා ලදි (Tuan 2008). ඒ අතරින් අන්යන් හා චෙන්ග් චෝ වඩාත් ම වැදගත් පුරාවිද්‍යා සාධක ලැබෙන අගනගරයන් වේ (Wyse, 1988).

අන්යන් නගරයේ රාජකීය, පුද්ගලික ගොඩනැගිලි හා දේවස්ථාන, පූජා අල්තාර හා ප්‍රාකාර ගොඩනැගීමේ දී මිනිසුන් හා සතුන් බහුල ලෙස බිලිදීම සිදුකර ඇත (Chang, 1986). පරපුරේ ආදිතමයන් (ඥාති දෙවියන්) පිදීම බහුලව දක්නට ලැබුණු පූජා විධියක් විය. ඒ නිසා ම එවැනි දෙවියන් වෙනුවෙන් තනන ලද දේවාල සඳහා විශාල වශයෙන් බිලිදීම් ක්‍රියාත්මක විය (Chang, 1964). මීට අමතරව සොහොන් ගර්භ සඳහා වහලුන්, පහළ සමාජවල සාමාජිකයන්, ඥාතීන් හා ඌරා, ගවයා, බැටළුවා, බල්ලා වැනි සතුන් බිලිදීම සඳහා යොදාගෙන ඇත (Liu, 2004). අන්යන්හි කැණීම්වලවල් 185 කින් මිනිසුන් 852 ක්, අශ්වයන් 15 ක්, ගවයන් 10 ක්, බැටළුවන් 08 ක් හා බල්ලන් 35 ක් අශ්වකරත්ත 5 ක් වාර්තා විය (Allan, 1991). 1978-81 අතර කැණීම්වලින් වැඩිහිටියන්ගේ හා දරුවන්ගේ හිස රහිත ඇටසැකිලි හා හිස්, නිවාස පාදම්වලින් ද උඩුබැලි හා මුනින් අතට වැටී සිටි මිනිසුන් කිහිප දෙනෙකු ද දේවස්ථාන පාදමකින් සොයාගැනිණි. මෙම පිරිස ඝාතනය කර තිබුණේ යටිහනුව ශරීරයට සිටින සේ හිස ඉතිරි කොටස වෙන් කිරීමෙනි (Keighthy 1999).





ශාන් රාජවංශයේ අවසන් ඇතුළු නගරයේ පාදම්වලින් අනාවරණය වූ හිස සුන් සිරුරුවලට වඩා වැඩි ආකර්ශනයක් හිමි වූයේ අස්ථි මත ලියූ අක්ෂර සහිත දහස් ගණනක් වූ සත්ත්ව ඇටකටුවලට ය.





ලෝකඩ ඉතා ම හොඳින් නිස්සාරණය කරගත් නිසා ආයුධ, යුධ යන්ත්‍ර, ජේඩ් නිර්මාණ, වාස්තුවිද්‍යා නිර්මාණ, සංකීර්ණ ස්වරූපයක් ගන්නට විය. විශේෂයෙන් යුධ ආක්‍රමණ එල්ල කිරීමත් එමගින් වහලුන් විශාල වශයෙන් ජීවග්‍රහණයෙන් අල්ලාගෙන තමාට අවශ්‍ය විටක බිලි දීමටත් ලෝකඩ ඉවහල් විය. අන්යන් නගරයේ අවම වශයෙන් හෝ එක් රජකෙනෙක් සඳහා 550 දෙනෙකු ඝාතනය කර ඇත (Keigthey, 1990). මෙම සොහොන් සංකීර්ණයෙන් විශාල ප්‍රමාණයේ සොහොන් 11 ක් ද කුඩා ප්‍රමාණයේ සොහොන් දහසකට වැඩි ප්‍රමාණයක් ද වාර්තා විය. මෙම සෑම සොහොනක ම අවම වශයෙන් එක් මානව බිල්ලක්වත් තැන්පත් කර තිබූ අතර සමාජ තත්ත්වය අනුව සංඛ්‍යාව වෙනස් වී තිබේ. මෙහි වූ ප්‍රධාන සොහොනට පිවිසීමට සිව් දිසා මාර්ග තනා ස්ත්‍රී පුරුෂ 48 දෙනෙකු, බල්ලන් 06 දෙනෙකු ඝාතනය කර හිස් ප්‍රධාන ගර්භය දෙසට හරවා තිබිණි.





හසි පෙයි කන්ග් (Hsi pei kang) සොහොන් භූමිය 1928 දී කැණීමට ලක්කරන ලදි. උතුරු දකුණු දිසානතියට රාජකීය සොහොන් ගණනාවක් ම මෙම භූමියෙන් වාර්තා විය. ඒ අතර අංක 1001 සොහොනෙන් ශිලා හා ජේඩ් ප්‍රතිමා, කැටයම් කළ ඇටකටු, ආයුධ ඇතුළු පුරාවස්තු රාශියක් අනාවරණය කරගන්නට හැකි විය. මෙම සොහොනේ වූ දින්ග් (Wu Ding) රජුට අයත් යැයි සැලකෙන අතර එමගින් හිස් 73 ක් හා හිසසුන් සැකිලි 59 ක් ඇතුළු මිනිසුන් 400 ක් පමණ බිලිදීම් සිදුව ඇති බවට සාක්ෂි ලැබිණි. මෙම සොහොනට ගිනිකොන දෙසින් කළ කැණීම්වලින් 1330 ක් පමණ වූ මිනිසුන් බිලි දී තිබුණි (Allan, 1991).

අන්යන්ග් හි කරනලද කැණීම්වලින් වූ දින්ග් රජුගේ බිසෝවරුන් වූ ජින්ග් (Jing) හා හාවෝ (Hao) යන රාජකීය, කාන්තාවන්ගේ සොහොන්වල ඉතා විශාල වූ රාජකීය උපකරණ තැන්පත් කර තිබිණි. මානවයන් 38 ක් හා එක් බල්ලෙකු ඝාතනය කර ජින්ගේ සොහොනේ තැන්පත් කර තිබුණු (Aylon, 2002) අතර හාවෝගේ සොහොනේ ද ජින්ග් සොහොනට සමාන මානව බිලි ද, ඉතා වටිනා ලෝකඩ භාණ්ඩ එකතුවක් ද අන්තර්ගත විය. සියාවෝතුන් (xiaotun) නම් ගම්මානයේ කරන ලද සොහොන් ගර්භ කැණීම්වල අංක M3 බල්ලන් තිදෙනෙක් හා කාන්තාවන් ද, M4 හි පුරුෂයන් දෙදෙනෙක් ද M5 හි කාන්තාවන් හය දෙනෙක් ද, M6 හි කාන්තාවන් හා පුරුෂයන් 7 දෙනෙක් ද, M7 හි කාන්තාවක් ද, M12 පුරුෂයන් හතරක් ද, M18 හි පුරුෂයන් පහක් හා බල්ලෙක් ද ආදී වශයෙන් බිලි දී තිබිණි. මෙම සියලුම ඝාතනයන් සිදුකර තිබුණේ අත් පා බැඳ දැමීමෙන් අනතුරුවය (Lindnff, 2002).







උතුරු අන්හුවෙයි ගම්මානයේ කරන ලද කැණීමකින් විවිධ දිශාවන්ට හැරීගිය දනහිස් නැමුණු එමෙන්ම දෑත් පිටුපසට බැඳ තිබුණු මානව හා බල්ලන්ගේ ඇටසැකිලි වාර්තා විය (Bulling, 1977). මේ අතර කුඩු වූ කාන්තාවක් ද දක්නට ලැබීම විශේෂත්වයකි. මේ සියලුම දෙනා ගල්ගසා මරා දැමුණු බවට ඉඟිකෙරෙන ගල් සෑම ස්ථරයක ම පැවති අතර එමගින් අනාවරණය වූයේ සැලකියයුතු කාලයක් මෙම ස්ථානයේ මානවයින් හා බල්ලන් ගල් ගසා මැරීම සිදු කළ බවයි. ත්‍රිකෝණ ස්වරූපයට තබන ලද ගල් කුට්ටි තුනක් මැද තවත් එක් ගලක් තැබීමෙන් සාදන ලද විශේෂ සැකසුමක් හඳුනා ගැනුණේ අභිචාර හෝ දෙවියන් හෝ යක්ෂයන් නියෝජනය කිරීමක් වශයෙනි. මානව අවශේෂ ඉතා හොඳින් ආරක්ෂා නොවන භූමියක වුවත් මානවයන් විසි එකක හා බල්ලන් දොළොස් දෙනෙකුට අයත් අවශේෂ අනාවරණය විය. මානවයන් වැඩි වශයෙන් අවුරුදු විස්සට අඩු යෞවනයන් වීම විශේෂත්වයකි. මෙම කැණීම් වලේ ස්ථරයන් පරීක්ෂා කිරීමෙන් පෙනී ගියේ ආරම්භක කාලයට වඩා පසුකාලීනව බල්ලන්ගේ ඇටසැකිලි අඩුවී මානව ඇටසැකිලි වැඩි වූ බවයි.

ශාන් රාජ වංශයට රාජ්‍යත්වයට පත්වූ කාල වකවානුවේ දී බහු දේව වාදී ඇදහිලි ක්‍රමයක් ස්ථාපිතව තිබිණි. ඉරු සඳු, තාරකා, මුහුද, ගංගා, අකුණු, වර්ෂාව ආදී ස්වභාවික වස්තූන් හා



බලවේග දෙවියන් වූ අතර ඒ සියලු ම දෙනා සඳහා මිනිසුන් හා සතුන් බිලිදීම සිදුවිය. භූමියට අරක්ගත් දෙවියන් වෙනුවෙන් සෑම වාස්තු විද්‍යාත්මක ඉදිකිරීමක් සඳහා ම බිලිදීම අත්‍යාවශයව පැවතිණ. මෙම බිලිදීම ශාන් රාජවංශයේ බිඳවැටීමත් සමග අවම වී ගිය නමුත් තවත් සියවස් ගණනාවක් ම මෙම සම්ප්‍රදායයන් ගලා යන්නට විය. කොන්ෆියුසියස් වැනි දාර්ශනිකයන්ගේ පහළවීමත් සමග බිලිදීම් සම්ප්‍රදායන් සමාජයෙන් ක්‍රමයෙන් පහව ගියේය.

## ආශ්‍රිත ග්‍රන්ථ


Allan, S. (1991). *The shape of turtle Myth, Art and cosmos in early China*, State University New York, Albany, USA. (1-8)

Aylon, M.R. (2002). *Pursuit of gender- Worldwide archaeological approaches*, Rowman and Littlefield publishers Inc, 1630, North Main Street, walnut, Creek. (263-266)

Bulling, A.G. (1977). A late Shang place of sacrifice and its historic significance, *Expedition,* Johnson reprint crop, New York. (1-7)

Chang Kwang-chih. (1964). Some dualistic phenomena in Shang society, *The journal of Asian studies*, Association of Asian studies, 1021 east Huron street, Ann Arbor, USA.(46, 56-57)

Chang Kwang-Chih. (1986). *The archaeology of ancient China*, Yale university press, New Haven, London. (226,273,317-323, 331, 374)

Keightley, D.N. (1990). Early civilization in China, in Ropp P.S (edi), *Heritage of China, contemporary perspectives of Chinese civilization*, University of California press, USA. (30)

Linduft, K.M. (2002). Women's lives memorialized in burial ancient China at Anyang, in Nelson, S.M and Ayalon, M.R. (eds) *In pursuit of gender: World wide Archaeology approachs,* Rowman and Littlefield publishers Inc, 1630, North mean street, walnut, Greek. (257,265,282-285)





Liu Li. (2004). *The Chinese Neolithic- Trajectories to early stages*, The press syndicate of the university of Cambridge, The Pitt building, Trumpington street, Cambridge, UK. (46-48)

Wyse, E and others, (1988), *Past worlds* (The times atlas of Archaeology), Times book limited, USA. (48, 134, 146-147)